## 1. විසර්ජන ශිර්ෂය - 145 - නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

### 1.1 විගණන විෂය පථය

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි සම්බන්ධ ලේඛණය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.635,497,555 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.545,902,171 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.89,595,384 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක ප්‍රතිශතයක් ගෙන තිබුණ. විස්තර පහත පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 272,555,000 | 225,905,000 | 25,773,688 | 11 |
| මූලධන | 209,050,000 | 409,592,555 | 63,821,696 | 15 |
| එකතුව | 481,605,000 | 635,497,555 | 89,595,384 | |

(ii) අයවැය විචලනය

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.400,000 ක මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ත් සියයට 92 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 14501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 4,000,000 | 3,567,003 | 2,500,000 | 5,534,756 | 13,000,000 | 9,110,270 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

( අ ) විෂය අංක 14501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.184,520 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂය 2013 අගෝස්තු 31 දින දක්වා අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

( ආ ) අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ගිණුම් ශේෂ ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණමේ ශේෂය රු.11,635,219 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 15/56 | 11,635,219 |

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් , දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් , එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2011 දෙසැම්බර් 31 උන වන විටත් පිළියෙල කර නොතිබුණි.එය පිළියෙල කර තිබුණේ 2012 ජුලි 31 දිනදීය.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීත හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) මුදල් රෙගුලාසි** | | |
| (i) මු.රෙ. 104 | - | හානි පිළිබඳව විගණකාධිපති වෙත දැනුම් දිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය |

| | | | |
|---|---|---|---|
| | | | තුලදී සිදු වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධව එවැන්නක් සිදුකර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 110 | - | පාඩු හා හානි සම්බන්ධව ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) | මු.රෙ. 371(2)(ආ) | 819,318 | අමාත්‍යාංශයේ නිලධාරීන්ට ගෙවනු ලබන අත්තිකාරම් එක් අවස්ථාවකදී රු.20,000 කට වැඩි නොවිය යුතු වුවද, ඊට අනුකූල නොවී අවස්ථා 17 කදී එම සීමාව ඉක්මවා අත්තිකාරම් වශයෙන් රු.819,318 ක මුදලක් ලබාදී තිබුණි. |
| (iv) | මු.රෙ. 371(2)(ඇ) | 914,318 | ලබාගන්නා ලද අත්තිකාරම් මුදල් කාර්ය නිමකල විගස පියවිය යුතු වුවද අවස්ථා 24 කදී ගෙවා ඇති එකතුව රු.914,318 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමට මාස 01 සිට මාස 07 දක්වා වූ කාල පරාසයක් ප්‍රමාදව තිබුණි. |
| (v) | මු.රෙ. 1646 | - | මාසික දෛනික ධාවන සටහන්පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | මු.රෙ. 1647 (ආ) | | වාහනද ඒවායේ උපකරණ පිළිබඳවද සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව පැවැත්විය යුතු වුවත්, එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 චක්‍රලේඛය | 114,617,018 | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |

## 1.6 කාර්ය සාධනය

2012 ක්‍රියාකාර සැලසුමට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැලිඔය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අවතැන් වූ හා පීඩාවට පත්වූ පවුල් 500 ක් සඳහා නව නිවාස 500 ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 150 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර, එයින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 149.90 ක් ලබාදී තිබුණි. විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව එදිනට සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව 06 ක් සහ අර්ධ නිමි නිවාස සංඛ්‍යාව 465 ක් වූ අතර ඒ සඳහා රු.මිලියන 102.64 ක් වියදම් දරා තිබුණි.

## 1.7. අවිධිමත් ගණුදෙනු

අමාත්‍යාංශය සතු අංක JN-3617 දරන ජීප් රථය 2011 සැප්තැම්බර් 05 දින අනතුරකට පත්වී අළුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීමක් නොකර පුද්ගලික සමාගමක් වෙත භාරදී තිබුණ අතර, එහි ඇස්තමේන්තු වටිනාකම රු.3,500,000ක් වී තිබුණි. මෙම ජීප් රථය අළුත්වැඩියා කටයුතු 2013 ජූලි 31 දින වනවිටත් අවසන්වී නොතිබුණු අතර, එම සමාගමට රු.700,000 ක් අත්තිකාරම් වශයෙන් ද ලබා දී තිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 07 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 04 | - | 04 |
| (iii) | ද්විතියක මට්ටම | 84 | 66 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 21 | 06 |
| | එකතුව | 126 | 94 | 32 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 32 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.